# සූසැට ආකාර වශීතාව සහිත ආශ්‍රවක්ෂයකර ඥානය

දේශකයාණන්වහන්සේ
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ
ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාධිපති මහෝපාධ්‍ය,
ත්‍රිපිටක වාගීෂ්වරාචාර්ය සාසනධජ
මහා කම්මට්ඨානාචාර්ය
අති පූජ්‍ය නා උයනේ අරියධම්ම ස්ථවිර

# සූසැට ආකාර වශීතාව

# සහිත

# ආශ්‍රවක්ෂයකර ඥානය

දේශකයාණන්වහන්සේ
ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ
ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාධිපති මහෝපාධ්‍ය,
ත්‍රිපිටක වාගීෂ්වරාචාර්ය සාසනධජ
මහා කම්මට්ඨානාචාර්ය
**අති පූජ්‍ය නාඋයනේ අරියධම්ම ස්ථවිර**

ධර්මදානය

**සත්ගුණවත් එච්. ජී. ආරියරත්න මහත්මයා.**
**සත්ගුණවත් චන්ද්‍රා ආරියරත්න මහත්මනී.**

2554 / 2011 අප්‍රේල් 24

උතුම් ධර්මදානයක් ලෙස පිළිගන්වන්නේ බැතියෙනි.

"සබ්බ දානං ධම්ම දානං ජිනාති"

(සියළු දානයන් පරදවා ධර්ම දානය ජය ගනී.)

# සුසැට ආකාර වශීතාව සහිත ආශ්‍රවක්ෂයකර ඥානය


ත්‍රිපිටක වාගීෂ්වරාචාර්ය සාසනධජ
මහා කම්මට්ඨානාචාර්ය
අති පූජ්‍ය නා උයනේ අරියධම්ම ස්ථවිර



© Lithira ලිහිර Printing Industries 2010 4 16

306, ඇඹුල්දෙණිය හංදිය, නුගේගොඩ.
0718152131/0114921309
lithira2008@yahoo.com

"අති පූජනීය

මහා කම්මට්ඨානාචාර්ය

නා උයනේ අරියධම්ම නාහිමිපාණන්

වහන්සේගේ

72 වැනි

ජන්ම දිනයට

උපහාරයක් වේවා"

# පෙරවදන

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස///**

නා උයන ආරණ්‍යස්ථ ශ්‍රී සම්බුද්ධ ශාසනානුග්‍රහ සමිතියේ ආරාධනාවෙන් කොළඹ 7, බෞද්ධාලෝක මාවතෙහි ශ්‍රී කල්‍යාණ ධර්ම ආශ්‍රම ශාලාවේදී අශ්‍රවක්ෂය ඥාන මාතෘකාවෙන් මා විසින් පවත්වන ලද දම් දෙසුම දහම් පොතක් බවට මෙසේ පත්වී ඇත.

පටිගත වූ දම් දෙසුම දහම් පොතක් වශයෙන් ධර්මදානය පිණිස මුද්‍රණය කරනුයේ වර්ෂයක් පාසා අපගේ ජන්මදින නිමිත්තෙන් ආශිර්වාද පිණිස ධර්මදානය සිදුකරනුයේ සත්ගුණවත් එච්.ජී. ආරියරත්න මහත්මයා සහ සත්ගුණවත් චන්ද්‍රා ආරියරත්න මහත්මනී ද විසින් ඉමහත් කරුණාවෙනි.

ආශ්‍රවක්ෂය ඥානය අර්ථ වශයෙන් ද ගාම්භීරය. ධර්ම වශයෙන් ද ගාම්භීරය. දේශනා වශයෙන් ද ගාම්භීරය. ප්‍රතිවේධ වශයෙන් ද ගාම්භීරය. ගාම්භීර ධර්මය දේශනා කිරීමත්, ශ්‍රවණය කිරීමත්, ලිවීමත්, මුද්‍රණය කරවා බෙදාදීමත්, කියවීමත් ගාම්භීර ප්‍රඥාව ප්‍රතිලාභය පිණිස හේතුවන ප්‍රඥා පාරමිතාවකි. එවැනි ධර්මය බෙදාදීම සියලු ආමිස දානයන් අභිභවා ජයගන්නා වූ ධර්ම දානයකි. සියලු ආමිස රසයන් අභිබවා ජයගන්නා වූ ධර්ම රසයකි. සියලු ආමිස ඡන්දය අභිභවා ජයගන්නා වූ ධර්ම ඡන්දයකි. සියලු දුක්ඛයන් අභිභවා නිවන් සුව ගෙන දෙන්නකි.

ධර්මදානමය කුශලය සත්ගුණවත් එච්.ජී. ආරියරත්න මහත්මයාටත්, සත්ගුණවත් චන්ද්‍රා ආරියරත්න මහත්මනීටත්, අමිලා ගමගේ රණසිංහ, අසංක ගමගේ දයාබර දරු දෙපළටත් ඒවින් තේනුක රණසිංහ, අනුක් ඒනුක රණසිංහ මුණුබුරු දෙපළටත්, දෙපාර්ශවයේම මවුපස, පියපස සියලු ඥාති හිත මිත්‍රයන්ටත් ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥාවත් දෙලොව සුබ සෙතත්, ශාන්ත නිවන් සුවය පිණිසත් හේතු වාසනා වේවා!

දම් දෙසුම් පිටපත් කළ පින්වත් මල්කා නෙළුම් මහත්මනීටත් නිරෝගි සුව දීර්ඝායුෂ අත්වේවා! එච්.ජී. ආරියරත්න මහත්ම මහත්මනීගේ මවුපිය සතරදෙනා සහිත පරලෝ සැපත් සියලු ඥාති මිත්‍රාදීන්ටත් සුගති සැපත්, ශාන්ති ලක්ෂණ නිර්වාණ ධාතුවත් , සුවසේ සාක්ෂාත් වේවා!

ශෝභන ලෙස පොත් මුද්‍රණය කරවූ මුද්‍රණාලයාධිපතිතුමන් ප්‍රධාන කාර්ය මණ්ඩලයට ආයුරාරෝග්‍යාදී ශ්‍රී සම්පත් අත්වේවා!


**"සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා"**

මෙයට,

මෙතැති,

**නා උයනේ අරියධම්ම ස්ථවිර.**

නා උයන ආරණ්‍ය සේනාසනය. 2011-04-16



# පුණ්‍යානුමෝදනාව

මහෝපාධ්‍ය ත්‍රිපිටක වාගීෂ්වරාචාර්‍ය, ශාසනධජ නම් ගෞරව නාමයෙන් පිදුම් ලද ශ්‍රී කල්‍යාණී යෝග්‍රාශ්‍රම සංස්ථා ප්‍රධාන අනුශාසක ධූරන්දර, මහා කම්මට්ඨානාචාර්‍ය පදවියෙන් පිදුම් ලත් අප නා උයනේ මහා නාහිමියන් වහන්සේට ඉතා ගෞරව, ආදර භක්තියෙන් දෙපා නැමද උපහාර පිණිස බැති සිතින් පිරිනමමු.

**සූසැට ආකාර වශීතාව සහිතආශ්‍රවක්‍ෂයකර ඥානය යනුවෙන් නිවන** දක්වා පෙළ ගැසෙන ධර්මතා පැහැදිලි කරමින්, පාරමී දම් පුරා ගැනීමට පහසු නිවැරදි මග බොදු ජනතාව මෙයින් පැහැදිලි වී ප්‍රඥාව අවධීකර ගැනීමට හැකි වේ. එයින් ජනිත වන කුසල ශක්තිය අප නා උයනේ නාහිමියන් වහන්සේට ජීවයක් මෙන් පාරමී ගුණ ධර්ම සපුරා ගැනීමට ඒකාන්තයෙන්ම හේතු වේවා! වාසනා වේවා!

උන්වහන්සේ බොදු මහ ජනතාවට මැණිකක් මෙනි. පිපාසයෙන් පෙළෙන ලෝ වැසියන් සිත් පහන් කරමින් නිවන් මඟට පෙළ ගස්වන්නේ දම් වැලක පුරුකක් මෙන් ශක්තිමත්ව පාරමී දම් පුරා ගැනීමේ අභිලාෂයෙන් කරන්නා වූ සියලු කුසල ශක්තිය ශ්‍රී කල්‍යාණ යෝගාශ්‍රමාධිපති ත්‍රිපිඨකාචාර්ය, මහා කම්මට්ඨානාචාර්ය අති ගෞරවණීය නා උයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේගේ ජීවිතයට ලැබී ආයුෂයෙන්, වර්ණයෙන්, සැපයෙන්, බලයෙන්, ප්‍රඥාවෙන්, අභිවර්ධනය වී නිදුක් නිරෝගීව සියවස් කලක් ලෝ වැසි ජනතාවට අර්ථයෙන්, ධර්මයෙන් අනුශාසනා කරමින් ප්‍රතිපත්ති ශාසනය නඟා සිටුවා ගැනීමට සියලු ආරක්ෂාව ආශිර්වාදය සූවිසි මහා ගුණ ආරක්ෂාව ලැබී කරන කියන බෙහෙත් ඖෂධ දිව්‍ය ඖෂධ බවට පත් වී නිදුක් නිරෝගී සුව දීර්ඝායුෂ ලැබේවා.!

අප වැනි අසරණ සත්ත්වයන් දුකින් මුදවා සිත් පහන් කර අමා මහ නිවනට යොමු කිරීමට, මතු ලොව්තුරා බුද්ධත්වයට මෙම ධර්ම දානමය කුසලය ඒකාන්තයෙන් උපනිශ්‍රය වේවා! උන්වහන්සේ මෙලොවට බිහි කළ දෙමාපියන්ට මෙම කුසලය අනුමෝදන් වී සුගති සැප, විඳ අමා මහා නිවනින් සැනසෙත්වා!

ප්‍රතිපත්ති ශාසනය රැක ගැනීමට පිහිටාදාර වූ මහා බෝධියට ගුණෝපේත අපවත් වී වදාල අති පූජණීය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශාභිධාන මාහිමියන් වහන්සේ, අති පූජණීය රාජකීය පණ්ඩිත මාතර සිරි ඥාණාරාමාභිධාන මහෝපාධ්‍ය මාහිමියන් වහන්සේ දෙනම මේ පින අනුමෝදන් වී බුදු සසුන රැක ගැනීමට නැවත මනුලොවට පැමිණ පාරමී දම් පුරා මතු ලොව්තුරා බුදුවේවා.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///

චතුසට්ඨියා ආකාරෙහි
තිණ්ණන්නං ඉන්ද්‍රියානං
වසී භාවතා පඤ්ඤා
ආසවානං ඛයෙ ඤාණන්ති

ශ්‍රද්ධාවන්ත පින්වත්නි!

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ දස බලධාරී සර්වඥරාජෝත්තමයාණන් වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂ කොට අවබෝධ කරන ලද ආසවක්ඛයකර ඥානය සම්බන්ධව තෙසැත්තෑ ඥානයන් අතුරෙන් 55 වෙනි අංකයට වැටෙන මේ ඥාන වස්තුව පිළිබඳවයි ධර්ම මාතෘකාව.

නා උයන ආරණ්‍යස්ථ ශ්‍රී සම්බුද්ධ ශාසන අනුග්‍රහ සමිතිය මගින් පැවැත්වෙන මෙම දෙවැනි ධර්ම දේශනාවට මාතෘකා වශයෙන් ආරාධනා ලැබුණේ ආසවක්ඛය ඥානය පිළිබඳව අවසර ලැබේවා යි ආරාධනාවයි.

බුදු, පසේ බුදු, මහරහතන් වහන්සේලාට පමණක් ලැබෙන මෙම උත්තරීතර ඥාන ධර්මය පිළිබඳව ධර්ම දේශනාවේ දී සමහර විට දහම් කරුණු ගැඹුරු වශයෙන් හිතෙන්න පුළුවනි. හේතුව කවදාවත් සිහිනයකින් වත් නොලැබූ උත්තරීතර ඥාන ධර්මයක් පිළිබඳ නිසයි.

විශේෂයෙන් ම බුද්ධාදී මහෝත්තමයාණන් වහන්සේලා විසින් කල්ප අසංඛෙය්‍ය ගණන් තිස්සේ බෝධි සම්භාර පුරාගෙනයි මෙම උත්තරීතර ඥානය සාක්ෂාත් කරගත්තේ. අපේ සර්වඥයාණන් වහන්සේ මේ සඳහා සත් අසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් සිතින් ම ප්‍රාර්ථනා කරමින් පෙරුම් පුරාගෙන ආවා. නව අසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේම වචනයෙන්ම බුදු බව පතමින් ආසවක්ඛයකර ඥානය සඳහා පාරමී පුරාගෙන වැඩියා.

දීපංකර පාදමූලයේ සිට බුද්ධ ශාසන 24 කදී විවරණ පතුල් ලබමින් සමතිංසත් පාරමිතා, ත්‍රිවිධ අර්ථචර්යා, පංච මහා පරිත්‍යාගයන් පවා

සිදුකරමින් බෝධි සම්භාර පුරාගෙන ආවා මේ උත්තරීතර ඥානය සාක්‍ෂාත් කරගන්න. බෝධි මූලයේ දී තමන් වහන්සේ ඉර බැස යන්න මත්තෙන් වසවර්ති දිව්‍ය පුත්‍රයා ඇතුළු පිරිස පලවා හැරලා ආනාපාන සති භාවනා කර්මස්ථානය පදනම් කරගෙන සියලු කර්මස්ථාන, ඒ කියන්නේ ධ්‍යාන භාවනා සියල්ල සම්පූර්ණ කොට අෂ්ඨ සමාපත්තිලාභීව රාත්‍රී පෙරයම් කාලේ පුබ්බේනිවාස ඥානයෙන් අතීතයේ අසංඛෙය්‍ය, අප්‍රමෙය්‍ය කාලයක් තිස්සේ ස්කන්ධ පරම්පරාව ආ හැටි නුවණින් දැක වදාළා. මැදියම දිබ්බචක්ඛු ඥානය මෙහෙයවා ලෝකයේ තියෙන සිත ඇති, සිත නැති සෑම දෙයක්ම හේතු ප්‍රත්‍යයෙන් හටගන්නා හැටි මැනවින් තේරුම් ගෙන, අභිඥාවෙන් තේරුම් ගෙන පටිච්ච සමුප්පාදයෙන් හේතු-ඵල ධර්මයට නුවණ මෙහෙයවලා, විදර්ශනා වඩලා අළුයම් කාලයේ දී සවාසන සකල ක්ලේෂයන් ප්‍රහාණය කරමින් දස බල ඥාන, චතු වෛශාරද්‍ය ඥාන, ෂට් අසාධාරණ ඥාන ආදී අනන්ත බුද්ධ ඥානයන් සහිතව සර්වඥතා ඥාන ප්‍රතිලාභයෙන් ලොවුතුරා සම්බුද්ධත්වයට පැමිණ වදාළා. ඒ මේ සර්වඥයන් වහන්සේගේ සන්තානයේ විද්‍යමාන වන ඥාන ධර්මයන් 73ක් පටිසම්භිදා මග්ග පාලියෙහි ධර්ම සේනාධිපති සාරිපුත්ත මහා රහතන් වහන්සේ විවරණය කොට වදාළා. එයින් 55 වෙනි මාතෘකාවයි මේ ඉදිරිපත් කෙරෙන්නේ.

| | | |
|---|---|---|
| **චතුසට්ඨියා ආකාරෙහි** | - | 64 ආකාරයකින් |
| **තිණ්ණන්නං ඉන්ද්‍රියානං** | - | ලෝකෝත්තර ඉන්ද්‍රිය ධර්ම 3 |
| **වසී භාවතා පඤ්ඤා** | - | වසී භාවයට පැමිණීමේ ප්‍රඥාව |
| **ආසවානං ඛයෙ ඤාණං** | - | ආසවක්ඛයකර ඥානයයි |

මේකයි කෙටි තේරුම. ආස්‍රව කියන එක අපි කලින් තේරුම් ගෙන තියෙනවා නේද?

ආසවක්ඛය කර ඥානය කියන්නේ, සතරාකාරයකින් මේ පැතිරී ගිය ආස්‍රවයන් ක්‍ෂය කිරීමේ උතුම් අවස්ථාවයි. මේ ආස්‍රව ශීර්ෂයෙන් 1500ක් ක්ලේශ ධර්ම තියෙනවා. ඒවා සම්පිණ්ඩනය කරගෙනයි මේ ආස්‍රව කියන වචනය පමණක් ඇතුළු කරලා තියෙන්නේ.

ආස්‍රව කියන්නේ, පින්වතුනි! දීර්ඝ කාලයක් තිස්සේ හිත ඇතුළේ පැසව පැසවා පවත්නා වූ ක්ලේශ ධර්මයන් 3ක්. වචන වශයෙන් ඒක හතරකට බෙදෙනවා.

★ කාමාස්‍රව කියන තෘෂ්ණාව
★ භවාස්‍රව කියන තෘෂ්ණාව
★ දිට්ඨාස්‍රව කියන මිථ්‍යා දෘෂ්ඨිය
★ අවිද්‍යාස්‍රව කියන මෝහය

මේ කියන තෘෂ්ණා, දෘෂ්ඨි, මෝහ කියන මේ ධර්මතා 3 තමා සතර ආකාකරයකින් බෙදිලා සතර ආකාරයකින් ආශ්‍රව කියලා කියන්නේ.

එතකොට කාමාස්‍රව කියන්නේ, එකළොස් කාමභූමිය තුළ යම්තාක් සුභ හෝ අසුභ හෝ යම්තාක් දේවල් පිළිබඳ ඇලීමක්, වෙළීමක්, බැඳීමක්, පැටලීමක්, ආසාවක්, ගිජුවීමක්, තෘෂ්ණාවෙන් බැසගැනීමක් තියෙනවා නම් ඒකට කියනවා කාමාස්‍රව කියලා.

භවාස්‍රව කියලා මෙතන හඳුන්වන්නේ, බ්‍රහ්ම ලෝක, රූපාවචර ලෝක, අරූපාවචර ලෝක සම්බන්ධව එහි ඇත්තා වූ ධ්‍යාන සුවය පිළිබඳවත්, භව සම්පත් ගැනත්, ඇලීම, බැඳීම, වෙළීම, පැටලීම, ගිජුවීම ආදී නමින් හැඳින්වෙන තෘෂ්ණාව භවාස්‍රව හැටියට හඳුන්වනවා.

දිට්ඨාස්‍රව කියන්නේ, ශාස්වත දෘෂ්ඨිය, උච්ඡේද දෘෂ්ඨිය මුල් කොට ඇති 62 ආකාරයකින් වූ මිථ්‍යා දෘෂ්ඨි සියල්ලම දිට්ඨාස්‍රව කියලා හැඳින්වෙනවා.

අවිද්‍යාස්‍රව කියන්නේ කොටින්ම මෝහය. මේ මෝහය කියන අඥානය බොහෝම පැටලිච්ච දෙයක්. මේ ධර්මතා තමා ආස්‍රව කියලා හඳුන්වන්නේ. ඒවාට ආස්‍රව කියන නම හැඳින්වෙන්නේ.

**ආ භවාග්ගං ආ ගොත්‍රභුං**
**වා සවන්තී ති ආසවා**

භවාග්‍රය දක්වා මේවා පැතිරෙනවා. සෝවාන් මාර්ගයට මුලින් එන ගොත්‍රභූ ඥානය දක්වා මේ ආස්‍රව පැතිරෙනවා. ගලනවා. ඒකියන්නේ එච්චර දුරට සෑම දෙයක්ම මේ ආස්‍රවයන් විසින් අරමුණු කරනු ලබනවා. ආශ්‍රවයන් විසින් ගිල ගනු ලැබෙනවා. ඒ නිසා ඒවාට කියනවා ආසශ්‍රව කියලා. ආස්‍රව කියන වචනය හැදිච්ච හැටි.

**ආ භවාග්ගං** කියන්නේ භවාග්‍රය දක්වා,
**සවන්තී ති** කියන්නේ පැතිරී යනවා,
**ආ ගොත්‍රභුං** කියන්නේ ගෝත්‍රභූ ඥානය දක්වා,

හිත ඇති හිත නැති සෑම වස්තුවක් කෙරෙහිම මේ ආස්‍රවයන් පැතිරීගෙන යනවා. ඒවාට ආස්‍රව කියනවා. අපේ ආයුර්වේදයේ තියෙනවා ආස්‍රව කියලා ඖෂධ විශේෂයක්. බොහෝ ඖෂධ සංයෝග කරලා ඒවා මාස ගණන් පල් කරන ස්වභාවයක් තියෙනවා. පල් කරලා පෙරා ගන්නවා. ඒකට කියනවා ආස්‍රව කියලා. ඒවායේ චිර පරිවාසයක් තියෙනවා.

**මදිරාදී චිර පරිවාසියට්ඨේන**
**ආසවා විය ආසවා**

බොහෝ කාලයක් පල් වෙවී පවතින නිසා ඒවාට ආස්‍රව කියනවා.

බොහෝ කාලයක් පැසවා පැසවා තියෙන මේ ක්ලේෂයන්ටත් කියනවා ආස්‍රව කියලා. ඒ මේ ආස්‍රවයන් ප්‍රහාණය කිරීම එසේ මෙසේ ලේසි දෙයක් නොවෙයි. ඒ සඳහා දීර්ඝ කාලයක් බෝධි සම්භාර පුරන්න ඕනේ. එහෙම නැතිනම් ආර්ය අෂ්ඨාංගික මාර්ගය සම්බන්ධව තියෙන බෝධිපාක්ෂික ධර්මයන් පිරෙන්න ඕනේ. වැඩෙන්නට ඕනේ. ඒවා ශක්තිමත් වූ වෙලාවට තමා ආස්‍රවයන් ක්ෂය කිරීමේ අවස්ථාව සැලසෙන්නේ. ඒ සම්බන්ධව කෙටියෙන් මෙහෙමයි.

ශීලයක පිහිටියා වූ ඥානවන්තයා ගුරු උපදේශ ඇතිව ශීල විසුද්ධියේ පිහිටා සමථ භාවනාවෙන් චිත්ත ඒකාග්‍රතාවය වඩනවා. චිත්ත ඒකග්‍රතාවයේ අවස්ථා 3ක් තියෙනවා.

★ උපචාර සමාධිය,

★ රූප ධ්‍යාන කියන අර්පණා සමාධිය,

★ අරූප ධ්‍යාන කියන අර්පණා සමාධිය.

එතකොට උපචාර ධ්‍යානයෙන් පුළුවනි ආසවක්ඛය කර ඥානය දක්වා යන්න. එහෙම නැතිනම් රූප ධ්‍යාන හතරට අනුව ආසවක්ඛය ඥානය දක්වා යන්න පුළුවනි.

එහෙම නැතිනම් අෂ්ඨ සමාපත්ති ලබාගෙන ආසවක්ඛය කර ඥානය දක්වා යන්න පුළුවනි. එසේම ධ්‍යාන සමාපත්තියට කියනවා චිත්ත විශුද්ධිය කියලා. චිත්ත විශුද්ධියේ පිහිටා ගත් ඥානවන්තයාට, යෝගාවචරයාට දිට්ඨි විශුද්ධිය කියන ධර්මතා සම්පාදනය කරනු පිණිස ඒ සමාධි ආලෝකය තමාගේ ස්කන්ධ සන්තානයට ආලෝකය විහිදුවලා සතර මහා භූත රූප ධර්මයන්, ඒ කියන්නේ පඨවි, ආපෝ, තේජෝ,

වායෝ මහා භූත ධර්මයන් අරමුණු කරනවා. මහා භූත රූපයන් ඇතුලේ තියෙන ශුද්ධාෂ්ඨක රූප 8 අරමුණු කරනවා. ශුද්ධාෂ්ඨක රූප සම්බන්ධව තියෙන කර්මජ රූප කලාප එක සන්තානයක 8 බැගින් සොයා ගන්නවා. චිත්ත සමුට්ඨාන රූප කලාප 8ත් සොයා ගන්නවා. ඍතු සමුට්ඨාන රූප කලාප 4 සොයා ගන්නවා. ආහාර රූප කලාප 2 සොයා ගන්නවා. ස්කන්ධ සන්තානයේ මේවා තියෙනවා.

ඊළඟට බාහිර වස්තුවල තියෙන නාම-රූප ධර්මයන් ද එසේම වෙන්කරගෙන බලනවා.

ඊළඟට චිත්ත සන්තානයේ සිත දියුණු කරලා ධ්‍යාන චිත්ත චෛතසික ධර්මයන් ද, ඒවගේම කාමාවචර කුසල චිත්ත චෛතසික ධර්මයන් ද, ඒවගේම අකුසල චිත්ත චෛතසික ධර්මයන් ද දොරටු 6 අනුව බලනවා.

තම සන්තානයේ නාම-රූප ධර්ම සියල්ල බලාගෙන බාහිර සන්තානවලත් නාම-රූප ධර්ම සොයා ගන්නවා. ඊළඟට එක එක චිත්තයට, එක එක චෛතසිකයට, එක එක රූපයට තියෙන,

★ **ලක්ඛණ,**

★ **රස,**

★ **පච්චුපට්ඨාන,**

★ **පදට්ඨාන,** මේ සියල්ල නුවණින් විමර්ශනය කරනවා. ඒකට කියනවා දිට්ඨි විශුද්ධිය කියලා.

දිට්ඨි විශුද්ධිය කියන්නේ නාම-රූප ධර්මයන් සියල්ල අවබෝධ කර ගැනීමයි. ඊළඟට මේ නාම-රූප ධර්මයන්ට හේතු වෙච්ච ධර්මයන් සොයා ගන්නවා. පටිච්ච සමුප්පාදයට අනුව නාම-රූප ධර්මයන් මොන මොන හේතු නිසා ද අතරක් නැර පේළියට පේළියට නාම-රූප පවතින්නේ දැයි සොයා ගන්නවා. ඒ සොයා ගැනීමේ දී එතුමාට පැහැදිළි වෙනවා අතීත භව කාලයෙහි අවිද්‍යාවයි, තෘෂ්ණාවයි, උපාදානයයි, සංස්කාරයයි, කර්මයයි. මේ කියන හේතු පස නිසා ප්‍රතිසන්ධි ගැනුනා. ප්‍රතිසන්ධි විඥ්ඥාණය නිසා මේ භවයෙහි නාම-රූප ධර්ම සහ චිත්ත චෛතසික ධර්ම පහළ වුනා.

ඒ නාමයත්-රූපයත් කියන චෛතසික රූප ධර්ම නිසා ආයතන 6 ක් පහළ වුනා. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන කියලා. මේ 6ට මුණගැහෙනවා ස්පර්ශ 6 ක්. ස්පර්ශ 6 නිසා වේදනා 6 ක් හමුවෙනවා. වේදනා 6 නිසා දොරටු වශයෙන් තෘෂ්ණා 6 ක් හටගන්නවා. තෘෂ්ණාව නිසා උපාදාන 4 ක් ඇතිවෙනවා. උපාදාන 4 නිසා කර්ම භවය ගොඩනැගෙනවා. කර්ම භවයෙන් නැවත උත්පත්ති භවයට සම්ප්‍රාප්ත වෙනවා. උත්පත්ති භවයෙහි නැවත ජාතිය කියන ඉපදීමත් ස්කන්ධ පංචකයෙහි නැවත ආරම්භයත් ඇතිවෙනවා පුනර්වභවයට.

ඊළඟට ස්කන්ධ පංචකයෙහි උපන්දා පටන්ම ජාතිය, ජරාව, ව්‍යාධිය, මරණය, සෝකය, පරිදේවය, දුක්ඛය, දෝමනස්සය, උපායාසය, අප්‍රිය සම්පයෝගය, ප්‍රිය විප්‍රයෝගය, ඉච්ඡා, විඝාත මේ දුක්ඛ රාශිය ඇති වෙන හැටි දකිනවා. මීට හේතු වශයෙන් හා පටිච්ච සමුප්පාදය ගැන අවබෝධය ඇති කරගන්නා වූ විශුද්ධියට කියනවා කංඛාවිතරණ විශුද්ධිය කියලා.

ඊළඟට බැසගන්නවා සම්මර්ෂණ ඥානයට, ඒ කියන්නේ දූන් නාමයත් රූපයත් දූනගෙන ඒවායේ හේතු සියල්ල දූකගෙන ඉන් පස්සේ ඒක හරවනවා 40 ආකාරයක ත්‍රිලක්ෂණයට. ඒ කියන්නේ අනිත්‍ය ලක්ෂණ 10 යි, දුක්ඛය ලක්ෂණ 25 යි, අනාත්ම ලක්ෂණ 5 යි කියන මේ 40 ආකාර සම්මර්ෂණය කරන්න පටන් ගන්නවා. වර්තමාන නාම-රූප, අතීත නාම-රූප, අනාගත නාම-රූප. ඒවගේම නාම-රූප දෙකොටසක් සම්මර්ෂණය කිරීමේදී තමා ඊළඟට ඇතිවන්නේ උදව්‍ය ඥානය. සම්මර්ෂණ ඥානයෙන් උදව්‍ය ඥානයට වැටීමට කියනවා මග්ගා මග්ග ඤාණ දස්සන විසුද්ධිය කියලා. ඒ උදව්‍ය ඥාන අවස්ථාවේ තමා බොහෝ දෙනෙක් රැවටෙන්නේ මම දූන් මාර්ගඵල ලැබුවා නේද කියලා. මොකද ඒ අවස්ථාවට ඇති වෙනවා බොහෝ ප්‍රසාදනීය අවස්ථා 10 ක්. සමහරුන්ට ඊට අඩුවෙන් ලැබෙනවා.

**ඕභාසො, ප්‍රීති, පස්සධි**
**අධිමොක්ඛො ච පග්ගහො**
**සුඛං ඤාණ උපට්ඨාන**
**උපෙක්ඛා ච නිකන්ති ච**

කියන මෙම ගාථාවෙන් කියවෙන උපක්ලේශ වශයෙන් කියවෙන 10 ක් තියෙනවා. මුලා වෙනවා. මම ධ්‍යානලාභි, මාර්ග ඵල ලාභි කියලා

හැඟීම් එන්න පුළුවනි. ඥානවන්ත යෝගාවචරයා ඒ සියල්ල ත්‍රිලක්ෂණයට හරවනවා. ආලෝකයත් ත්‍රිලක්ෂණයට හරවනවා. ඒ වගේම ප්‍රීයත් ත්‍රිලක්ෂණයට හරවනවා. පස්සද්ධිය ත්‍රිලක්ෂණයට හරවනවා. ඒ වගේම සැපයත් ත්‍රිලක්ෂණයට හරවනවා. සතියත් ත්‍රිලක්ෂණයට හරවනවා. ඥානයත් ත්‍රිලක්ෂණයට හරවනවා. උපෙක්ඛාවත් ත්‍රිලක්ෂණයට හරවනවා. මේ සියල්ලම ත්‍රිලක්ෂණයට හැරවීමෙන් ඥානවන්තයා නිවැරදි මාර්ගයට පිවිසෙනවා. ඒකට කියනවා මග්ගා මග්ග ඤාණ දස්සන විසුද්ධිය නැවත පටිපදා ඤාණ දස්සන විසුද්ධිය කියන ඥාන පේළියක් උපදවන්න තියෙන්නේ. ඒක බොහෝම ගාම්භිර අවස්ථාවක්. විදර්ශනා භංගානු පස්සනා විදර්ශනා ඥානය.

**භංගානු පස්සනා ඥානය,**

**රූප සප්තක වශයෙන්,**

අරූප සප්තක වශයෙන්, නාම-රූප ධර්මයන් සියල්ල සම්මර්ෂණය කරමින් ඒ සම්මර්ෂණය කරන ඥානයත් විදර්ශනාවට හරවනවා. ඒ නිසා ඉන් අනතුරුව භයතු පට්ඨාන ඥානය, ආදීනව ඥානය, නිබ්බිදා ඥානය, මුඤ්චිතු කම්‍යතා ඥානය, පටිසංඛානු පස්සනා ඥානය, සංඛාර උපේක්ඛා ඥානය කියන ඥාන පහළ වෙනවා.

එයින් සංඛාර උපේක්ඛා ඥාන අවස්ථාව කොටස් 3 කට බෙදෙනවා. ඒ කියන්නේ;

**මුඤ්චිතු කම්‍යතාව**

**පටිසංඛානුපසසනාව**

**සන්තිට්ඨානාව**

මේ අවස්ථා තුන. මෙය සංඛාර උපේක්ඛා හැටියට හැඳින්වෙනවා. ඊළඟට සංඛාර උපෙක්ඛා අවස්ථාවේ යෝගාවචරයාට විදර්ශනා කරන්න ඉතුරුවක් නැහැ. සියල්ල විපස්සනා කරලා අවසානයේදී ඔහු පුදුම විදියේ චිත්ත සමාධියකට පිවිසෙනවා. හරියට රූප ධ්‍යාන අතර චතුත්ථ ධ්‍යානයට සමවදිනවා වගේ. පුදුම විදියේ චිත්ත සමාධියක් ඒ මොහොතේ ඇති වෙනවා. පුදුමාකාර සමාධියක්. ඒකත් සමහරු සිතන්න පුළුවන් සෝවාන් වුනා, මාර්ග ඵල ලැබුවා, අර්හත් වුනා කියලා හිතන්න පුළුවනි. නැහැ එසේ මාර්ග ඵල ලැබීම නොවේ, ඒ වෙලාවේ යෝගාවචරයාට විදර්ශනාවට නැංවිය යුතු සියල්ලම නිමාවට පත් වූ නිසා ඒ පිළිබඳ සාර්ථක බවක් තමා

ඒ අවස්ථාව ඒ දුක්ඛ රාශිය එක පැත්තක තියෙනවා සංස්කාර, එහා පැත්තේ තියෙන නිර්වාණයට සිත නැවී ගත් අවබෝධයකින් සිටින්නේ. ඒ අවස්ථාවේ නැවත නැවත ආසේවන වශයෙන් වඩන කොට තමන්ගේ සන්තානයේ ඉන්ද්‍රිය ධර්ම, බල ධර්ම, බොජ්ඣංග ධර්ම සියල්ල වැඩීගෙන එන විට, ශක්තිමත් වන විට, සෝතාපත්ති මග්ග චිත්ත වීථිය පහළ වෙනවා. භවාංගයෙන් සිත අවදි වෙලා මනෝද්වාරාවර්ජන, පරිකර්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ කියන කාමාවචර ඥාන සම්ප්‍රයුක්ත සිත් 4 පහළ වෙනවා බොහෝ දෙනාට. සමහරුන්ට 3 කින් සම්පූර්ණ වෙනවා උපචාර, අනුලෝම, ගෝත්‍රභූ කියලා. ඒ ඉන්ද්‍රියයන්ගේ දියුණුව අනුවයි. තීක්ෂණ ඥානවන්තයාට අවස්ථා තුනකින් සිත මාර්ගයට පිවිසෙනවා. ඒ වගේම ඊට අඩු තීක්ෂණ ඥානවන්තයාට සතරාකාරයකින් ඥාන සම්ප්‍රයුක්ත සිත් පහළ වෙන්නේ. පරිකර්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ සතරයි. මේ ඥාන තුනටම කියනවා අනුලෝම ඥානය කියලා. තීක්ෂණ අනුලෝම ඥානය කියලා. ඒ වගේම අනුලෝම ක්ෂාන්තිය, තීක්ෂණ අනුලෝම ක්ෂාන්තිය කියනවා. බොහෝම වාසනාවන්ත වචන මේ තීක්ෂණ අනුලෝම කියන පරිකර්ම, උපචාර, අනුලෝම සිත් 3 ට තමන්ගේ සිතේ ඉන්ද්‍රිය ධර්මයන්ගේ භාවිතයට අනුව ශ්‍රද්ධාවන්තයෙක් නම් ඔහුට සංස්කාර අනිත්‍යය, අනිත්‍යය, අනිත්‍යය කියලා වැටහෙනවා. සමාධි ඉන්ද්‍රිය අධික නම් දුක්ඛයි, දුක්ඛයි, දුක්ඛයි කියා වැටහෙනවා. ප්‍රඥාව අධික යෝගාවචරයෙක් නම්, සංස්කාර අනාත්තය, අනාත්තය, අනාත්තය කියලා වැටහෙනවා. ඔය වැටහීම නිසා තමයි මාර්ග ඵල නිර්වාණයට නමක් ලැබෙන්නේ, අනිත්‍යය, අනිත්‍යය, අනිත්‍යය කියලා. මෙය වැටහුණු යෝගාවචරයාට, ඥානවන්තයාට කියන්නේ අනිමිත්ත විමෝක්ෂය කියලා.

ඒ වගේ දුක්ඛයි, දුක්ඛයි, දුක්ඛයි කියලා සමාධි අධික තැනැත්තාට මාර්ග ඵල නිර්වාණ ධර්මයන් අප්‍රණිහිත විමෝක්ෂ නමින් අවබෝධ වෙනවා. නම් ලැබෙනවා.

ඒ වගේම අනාත්තයි, අනාත්තයි, අනාත්තයි කියලා වැඩූ ඥානවන්ත යෝගාවචරයාට මාර්ග ඵල නිර්වාණය හඳුන්වන්නේ, සුඤ්ඤත විමෝක්ෂය කියන මේ නමින්.

එතකොට මේ අවස්ථාව ඉතාමත් වාසනාවන්ත අවස්ථාවක්.ඉන් පසු ගෝත්‍රභූ කියන සිත පහළ වන විට නිර්වාණය අරමුණු කිරීමක්

සිද්ධ වෙනවා. කෙලෙස් නැසීම නොවේ ඒ ගෝත්‍රභූ සිතේ භංගක්ෂණයට අනතුරුව ලැබෙනවා සෝතාපත්ති මග්ග චිත්තය. ඒක බොහෝ වාසනාවන්ත අවස්ථාවක්. සෝතාපත්ති මග්ග චිත්තයේ දී තමන් කවදාවත් සිහිනෙකින්වත් නොදුටුවා වූ දුක්ඛ, සමුදය, නිර්වාණය, මග්ග කියන චතුරාර්ය සත්‍ය ධර්මය ප්‍රත්‍යක්ෂ වශයෙන්ම නුවණින්ම දැක ගන්නවා.

ඊළඟට සෝතාපත්ති ඵල ඥාන වාර 2 ක් පහළ වෙනවා. අර අනුලෝම ඥාන 4 කින් කෙළවර වෙච්ච යෝගාවචරයාට නම් ඵල සිත් 3 ක් පහළ වෙනවා. ඔය විදියට ඒකට කියනවා මාර්ගාන්තර ඵලය කියලා. ඔය අවස්ථාව සම්පූර්ණ වෙනකොට සිත භවංග පතිත වෙලා ඊළඟට චිත්ත වීථි පේළි පේළි පහළ වෙනවා. මාර්ග වීථියෙන් පසු භවාංග වලට අනතුරුව මාර්ග ඵල ප්‍රත්‍යවේක්ෂා ඥානය පහළ වෙනවා.

ඊළඟට උදයව්‍ය ඥානය, විදර්ශනා ඥාන පේළි පේළි පතිත වෙලා හේතු සම්පත් තියෙනවා නම්, සකෘදාගාමී මාර්ග චිත්ත වීථි ඔය විදියටම පහළ වෙනවා. ඒ සෝතාපත්ති මාර්ග චිත්තය වගේම සකෘදාගාමී චිත්ත වීථි පහළ වෙලා ඉන් පසුව ප්‍රත්‍යවේක්ෂා චිත්ත වීථි පහළ වෙනවා.

ඊළඟට යනවා උදයව්‍ය ඥානයේ සිට විපස්සනා ඥානය වඩා අනාගාමී මාර්ග ඵල චිත්ත වීථි ලැබෙනවා. ඔය විදියට මාර්ග ඵල අවස්ථා 3 ක් ලබාගත් යෝගාවචරයන් වහන්සේ නැවතත් උදයව්‍ය ඥානයේ සිට විපස්සනා ඥාන කුළුගන්වාගෙන ගිහිල්ලා අර්හත් මාර්ග චිත්ත වීථිය ද ලබාගන්නවා. අර්හත් මාර්ග චිත්ත වීථි අවස්ථාව තමා මේ චතුසට්ඨියා අකාරෙහි කියන මේ නමින් හැඳින්වෙන්නේ.

මේ චතුසට්ඨියා අකාරෙහි කියන්නේ 64 ආකාරයකින් අර්හත් මාර්ගාංග ඥානය, ඵල ඥානය, වසී භාවතාවයට පැමිණෙනවා. දැන් අපි ඒක සන්සන්දනය කර බලමු. මොකද?

මේ චතුසට්ඨියා අකාරයෙන් කියන්නේ, 64 ආකාරය කියන්නේ බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළා ලෝකෝත්තර ඥාන 3 ක්. ඒ මොනවාද?

- ★ අනඤ්ඤාතඤ්ඤස්සාමීති ඉන්ද්‍රිය
- ★ අඤ්ඤින්ද්‍රිය
- ★ අඤ්ඤාතාවින්ද්‍රිය

සෝතාපත්ති මාර්ග ඥානයට කියනවා **අනඤ්ඤා තඤ්ඤස්සාමිති ඉන්‍ද්‍රිය** කියලා.

ඊළඟට සෝතාපත්ති ඵල ඥානය සකෘදාගාමි මාර්ග ඥාන, ඵල ඥාන 2 ද, අනාගාමි මාර්ග ඥාන, ඵල ඥාන 2 ද, අර්හත් මාර්ග ඥානය සමග 6 ට කියනවා **අඤ්ඤින්‍ද්‍රිය** කියලා.

අර්හත් ඵල ඥානයට **අඤ්ඤාතාවින්‍ද්‍රිය** කියනවා.

ඒකේ තේරුම මෙහෙමයි - සෝතාපත්ති මාර්ග ඥානයට අනඤ්ඤා තඤ්ඤස්සාමිති ඉන්‍ද්‍රිය කියන්නේ.

**අනඤ්ඤාත** කියන්නේ මේ දීර්ඝ සංසාරේ මෙතෙක් නුදුටුවා වූ ද, අවබෝධ නොකරන ලද්දා වූද යන තේරුමයි. **ඤස්සාමිති** කියන්නේ අනාදිමත් කාලයක් තිස්සේ අවබෝධ නොකළා වූ ද, ඒ ආර්ය සත්‍ය සතර, ඤස්සාමීති - දැනගන්නෙමි. මේ ආකාරයෙන් දැනගන්නා වූ ප්‍රඥාවට කියනවා. **අනඤ්ඤා තඤ්ඤස්සාමිති ඉන්‍ද්‍රිය** කියලා. කවදාවත් අවබෝධ නොකළා වූ සතර ආර්ය සත්‍ය ධර්මයන් අවබෝධ කරගන්නෙමි කියන ආකාරයෙන් පවත්නා වූ නුවණට කියනවා **අනඤ්ඤා තඤ්ඤස්සාමිති ඉන්‍ද්‍රිය** කියලා.

**අඤ්ඤින්‍ද්‍රිය** කියන්නේ සෝවාන් මාර්ගයෙන් දැක්කා වූ චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගත්තා. සෝවාන් මාර්ගයෙන් අවබෝධ කරගත් චතුරාර්ය සත්‍ය නැවත නැවත අවබෝධ කර ගැනීමට කියනවා **අඤ්ඤින්‍ද්‍රිය** කියලා. ඒ කියන්නේ දැක ගත්තා වූ ධර්මය නැවත නැවත අවබෝධ කරගන්නවා. සෝවාන් ඵලයට පත්වීමෙන් සෝවාන් මාර්ගයේ දී ලබා ගත්තා වූ අවබෝධයට පත්වුනා. ඒ වගේම සකෘදාගාමි මාර්ගයට පත්වීමත් ආර්ය සත්‍ය සතර ඊට වඩා පුළුල් අවබෝධයක් ලැබුණා. සකෘදාගාමි ඵලයට පත්වීමෙන් ඒ ශාන්ත ස්වභාවයට පත් වෙනවා. අවබෝධය ශාන්ත ස්වභාවයට පත්වෙනවා කියනවා. සිදුවෙනවා. ඒකට කියනවා සන්සිඳීම පටිප්පස්සධි කියලා.

ඊළඟට අනාගාමි මාර්ග ඵල ඥාන අවස්ථාවේ ද ඊටත් වඩා අවබෝධයෙන් චතුරාර්ය සත්‍යය දැනගන්නවා. ඵලයට පත්වීමෙන් සන්සිඳීමේ සැපයට පත්වෙනවා. ඊට පසු අර්හත් මාර්ගයට පැමිණීමෙන් ඒ මුල් අවස්ථා 3 `ටත් වඩා උත්තරීතර ආකාරයෙන් අවබෝධයට

පත්වෙනවා. ගගන තලයේ දිස්වෙන සූර්ය මණ්ඩලය සේ ප්‍රඥා ආලෝකයෙන් චතුරාර්ය සත්‍ය ධර්මය මැනවින් දැක ගන්නවා. ඔය කියන අවස්ථා 6 ට කියනවා අඤ්ඤින්ද්‍රිය කියලා. දැන ගත්තා වූ දෙය නැවත දැන ගැනීම. ඊළඟට අඤ්ඤතාවීන්ද්‍රිය කියන්නේ රහතන් වහන්සේට, අශෛකයන් වහන්සේට, මේ උත්තමයන් වහන්සේට කියන්නේ අඤ්ඤතාවීන්ද්‍රිය අවබෝධ කරගත්ත උත්තමයන් වහන්සේ. මේ අඤ්ඤතාවී කියන උත්තමයන් වහන්සේගේ ප්‍රඥාවට කියනවා අඤ්ඤතාවීන්ද්‍රිය. මේ ඉන්ද්‍රිය ඉන්ද්‍රිය කියන්නේ කුමක්ද? කියලා අපි තේරුම් ගන්න ඕනේ. ඉන්ද්‍රිය ඉන්ද්‍රිය කියන එකේ තේරුම් කීපයක් තියෙනවා. එහි කෙටි තේරුම තමා ඉසුරුමත් බව, ප්‍රධාන බව, යන ආකාර 2 ක් තියෙනවා. ඒක අධිපති හැටියට හඳුන්වනවා. සර්වත්‍ර අධිපති, ප්‍රදේශ අධිපති, කියලා දෙයාකාරයකට ඉන්ද්‍රිය භාවය නැතිනම් අධිපති භාවය හඳුන්වනවා.

සර්වත්‍ර අධිපති කියන්නේ; ඡන්ද, චිත්ත, වීරිය, විමංසා. මෙන්න මේ කියන ඍද්ධි පාද හතරට කියනවා සර්වත්‍ර අධිපති කියලා පාලියෙන්. සිංහල වචනයෙන් කියනවා සර්වත්‍රාධිපති කියලා. හැම තැනකම අධිපතිකම් කරනවා මේ කියන හතර දෙනා.

ඡන්ද, චිත්ත, විරිය, විමංසා ඍද්ධිපාද වශයෙන් හඳුන්වනවා. අධිපති හැටියටත් හඳුන්වනවා. හැම තැනකම අධිපති.

මනුෂ්‍ය ලෝකයේ චක්‍රවර්ති රාජ්‍යය වගේ. තව්තිසා භවනේ සක් දෙව් රාජ්‍යය සම්පත වගේ. ඒ වගේම තුන්වෙනි බ්‍රහ්ම තලයේ බ්‍රහ්ම රාජ්‍යය හා සමානයි. ඒ හැම තැනකම ඒ තැනැත්තා අධිපති. ඒ වගේ තමා මේ සර්වත්‍රාධිපති කියන ඡන්ද, චිත්ත, විරිය, විමංසා කියන අධිපති. ඉන්ද්‍රිය කියන්නේ ප්‍රදේශ අධිපති ධර්ම තමන්ට යටත් වන ප්‍රදේශයට පමණක් අධිපති කරනවා. ඒ වගේ ඉන්ද්‍රිය ධර්ම සේරම තියෙනවා 22 ක්. එයින් 3 ක් තමා කෙළින්ම ලෝකෝත්තර ධර්ම හැටියට හඳුන්වන්නේ. අනඤ්ඤා තඤ්ඤස්සාමීති ඉන්ද්‍රිය කියන්නේ සෝවාන් මාර්ග සිතේ පවත්නා වූ, ප්‍රඥාවෙන් කවදාවත් නුදුටුවා වූ, චතුරාර්ය සත්‍ය ධර්මය ප්‍රත්‍යක්‍ෂ කර ගැනීම. එතකොට එතෙන්දි මේ ඥානය චතුරාර්ය සත්‍යය ප්‍රත්‍යක්‍ෂ කර ගැනීමට ඉසුරුමත් වෙනවා. ප්‍රධාන වෙනවා. අධිපති වෙනවා. ඒකට කියනවා අනඤ්ඤා තඤ්ඤස්සාමීති ඉන්ද්‍රිය කියලා.

අඤ්ඤින්ද්‍රිය කියන කොටත් ඒ වගේ තමා මැද අවස්ථා 6 යේ දී චතුරාර්ය සත්‍ය ධර්මය නැවත නැවත අවබෝධ කර ගන්නා බැවින් ඊට ඉසුරුමත් බැවින් අඤ්ඤින්ද්‍රිය කියනවා.

ඒ වගේම ඛීණාස්‍රව මහ රහතන් වහන්සේ කෙනෙකුගේ සන්තානයේ අර්හත් ඵලයට පැමිණීමෙන් දත යුතු ආර්ය සත්‍ය 4 සියල්ලෙන් සියල්ල අවබෝධ කරගත්ත නිසා උන්වහන්සේගේ අවබෝධඥානයට කියනවා, අවබෝධ කළ උත්තමයාගේ ඉන්ද්‍රිය කියලා. එනම් අර්හත් ඵල ඥානය පිළිබඳවයි.

එතැනදී ආසවා නං ඛයෙ කියන්නේ ඇත්තටම අර්හත් මාර්ග අවස්ථාවයි. නමුත් අර්හත් ඵලයට පැමිණීම එහි ප්‍රතිඵලය බැවින් එතැනට මේක සම්බන්ධ වෙනවා.

දැන් 64 ආකාරය අහුලා ගනිමු. සෝතාපත්ති මග්ග ඥානයේ අනඤ්ඤාතඤ්ඤස්සාමීති ඉන්ද්‍රියට

| | | | |
|---|---|---|---|
| සද්ධා | ඉන්ද්‍රිය | අධිමොක්ඛ | ආකාරයෙන් |
| විරිය | ඉන්ද්‍රිය | පග්ගහ | ආකාරයෙන් |
| සති | ඉන්ද්‍රිය | උපට්ඨාන | ආකාරයෙන් |
| සමාධි | ඉන්ද්‍රිය | අවික්ෂේප | ආකාරයෙන් |
| ප්‍රඥා | ඉන්ද්‍රිය | දස්සන | ආකාරයෙන් |
| මන | ඉන්ද්‍රිය | විජානන | ආකාරයෙන් |
| සෝමනස්ස | ඉන්ද්‍රිය | අභිසන්දන | ආකාරයෙන් |
| ජීවිත | ඉන්ද්‍රිය | පවත්ත සන්තතාධිපති | ආකාරයෙන් |

මෙන්න මේ කියන කරුණු 8 යි. ඉන්ද්‍රිය 8 මෙතැන හැඳින්වෙනවා.

සද්ධා ඉන්ද්‍රිය, විරිය ඉන්ද්‍රිය, සති ඉන්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, ප්‍රඥා ඉන්ද්‍රිය, මන ඉන්ද්‍රිය, සෝමනස්ස ඉන්ද්‍රිය සහ ජීවිත ඉන්ද්‍රිය. ඒ කියන්නේ නාම ජීවිත ඉන්ද්‍රිය. එතකොට මෙහිදී අර සෝතාපත්ති මාර්ග ඥාන අවස්ථාවේ දී මේ ඉන්ද්‍රිය 8 දෙනාම එකතු වෙනවා. සෝතාපත්ති මාර්ග ඥානයට එකතු වෙනවා. ඉසුරුමත් බැවින් සෝතාපත්ති මාර්ග ඥානය ප්‍රසන්න බවටත් ප්‍රසාදයටත් පත් කරන්නේ කවුද?

අධිමෝක්ෂ ආකාරයෙන් කියන්නේ නොසැලෙන ස්ථිර වශයෙන් පවත්නා ප්‍රසාදයට කියනවා අධිමෝක්ෂය කියලා. මේ අධිමෝක්ෂ

ආකාරයෙන් පහළ වන සද්ධාවට කියනවා අධිමෝක්ෂ සද්ධා ඉන්ද්‍රිය කියලා. ඒ සද්ධා ඉන්ද්‍රියෙන්, ඒ සෝතාපත්ති මාර්ග ඥානය වසී භාවයට පත්වෙනවා.

ඊළඟට විරිය ඉන්ද්‍රිය. විරිය ඉන්ද්‍රියෙන් කරන්නේ පග්ගහ. ඒ කියන්නේ දිරිමත් කරනවා. සෝතාපත්ති මාර්ග ඥානය ධෛර්යමත් කරනවා. විරිය ඉන්ද්‍රියෙන් ඒක වසී භාවයට පැමිණෙනවා.

ඊළඟට සති ඉන්ද්‍රිය. සති ඉන්ද්‍රියෙන් කෙරෙන්නේ උපට්ඨානය. විසිරෙන්නේ නැතිව හරියටම ඍජුවම අරමුණු කරන්නේ සතියෙන්. සති ඉන්ද්‍රියෙන් සෝතාපත්ති මාර්ග ඥානය වසී භාවයට පත්වෙනවා.

ඊළඟට සමාධි ඉන්ද්‍රිය. සමාධි ඉන්ද්‍රිය කියන්නේ සෝතාපත්ති මාර්ග ඥානය සම්ප්‍රයුක්තව තියෙනවානේ ඒකග්ගතාවය. ඒකට කියනවා ආනන්තරික සමාධි කියලා. ඒ කියන්නේ මාර්ගයට අනතුරුව ඵලය ගෙනදීමේ සමාධිය. ඒ සමාධි ඉන්ද්‍රිය අවික්ෂේප අර්ථයෙන් වසී භාවයට පත් කරනවා. අනඤ්ඤාතඤ්ඤස්සාමීති ඉන්ද්‍රිය සෝතාපත්ති මාර්ගය සමාධියෙන් වසී භාවටය පත් වෙනවා.

ඊළඟට ප්‍රඥා ඉන්ද්‍රිය. ප්‍රඥා ඉන්ද්‍රියෙන් දස්සන කෘත්‍යය සිදුකරනවා. කවදාවත් නුදුටුවා වූ චතුරාර්ය සත්‍ය ධර්මය දැක ගැනීම කර ගන්නේ ආලෝකමත් කොට අවබෝධ කර ගන්නේ මේ ප්‍රඥා ඉන්ද්‍රිය. ඒකට කියනවා ප්‍රඥා ඉන්ද්‍රියෙන් සෝතාපත්ති මාර්ග ඥානය වසීභාවයට පැමිණවීම සිදුකරනවා.

ඊළඟට මන ඉන්ද්‍රිය. මන ඉන්ද්‍රිය කියන්නේ අරමුණු ගැනීම. චතුරාර්ය සත්‍යයත් අරමුණු වශයෙන් ගන්නේ නිරෝධ සත්‍යය. නිරෝධ සත්‍යය හරියට අරමුණු කරනවා. මේ මන ඉන්ද්‍රියෙන් ඒ මාර්ග ඥානය වසී භාවයට පැමිණෙනවා.

ඊළඟට සෝමනස්ස ඉන්ද්‍රිය. සෝමනස්ස ඉන්ද්‍රිය කියන්නේ මෙතන සෝමනස්ස සහගත සිතින් මාර්ග ලබන අවස්ථාව ගැනයි. චතුර්ථ ධ්‍යාන අවස්ථාවට ඒක ලැබෙන්නේ නැහැ. උපේක්ඛා ඉන්ද්‍රියෙන් ඒක ලැබෙන්නේ. සෝතාපත්ති මාර්ග අවස්ථාවේදී සෝමනස්ස ඉන්ද්‍රිය කියන තමාගේ සෝමනස්ස ඉන්ද්‍රිය වශයෙන් අභිසන්දහන කරනවා. කියන්නේ ඒ සෝමනස්ස ඉන්ද්‍රියට සම්බන්ධ චිත්ත චෛතසික ධර්ම තියෙනවා නේ. ඒ 36 දෙනා බොහෝම සැපවත් බවට පත් කිරීම තමා අභිසන්දහන

කියන්නේ. හරියට චූර්ණයක් වැනි දෙයක් මී පැණි දාලා හෝ වතුර බිංදු දාලා මිශ්‍ර කරන්නා සේ සමාධි ඉන්ද්‍රියෙන් ඒකග්ගතා වෙනවා. ඒ සියලුම චිත්ත චෛතසික ධර්ම 36 යි. සිතත් එක්ක 37 යි. මාර්ග සිතේ සම්පූර්ණයෙන්ම වසී භාවයට පමුණුවනවා.

ඊළඟට ජීවිත ඉන්ද්‍රිය. ජීවිත ඉන්ද්‍රිය කියන්නේ නාම ජීවිත ඉන්ද්‍රියයි. චෛතසික වශයෙන් පහළ වෙන ජීවිත ඉන්ද්‍රිය. චෛතසිකය. ඒකෙන් කෙරෙන්නේ පවත්ත සන්තතාධිපති භාවය. ඒ කියන්නේ තමන් සමග එකට උපදින්නා වූ මේ චිත්ත චෛතසික ධර්ම සියල්ල ආරක්ෂා කරගන්නවා. රැක ගන්නවා. පාලනය කරනවා. ඒ පාලනය කෙරෙන්නේ තමාගේ ජීවිත ඉන්ද්‍රිය තුළින්. ජීවිත ඉන්ද්‍රිය සෝතාපත්ති මාර්ග සිතේ චිත්ත චෛතසික ධර්ම ආරක්ෂා කර ගැනීම් වශයෙන් වසී භාවයට පමුණුවනවා.

මේ කියන ඉන්ද්‍රිය ධර්මයෝ 8 දෙනා සද්ධා ඉන්ද්‍රිය, විරිය ඉන්ද්‍රිය, සති ඉන්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, ප්‍රඥා ඉන්ද්‍රිය, මන ඉන්ද්‍රිය, සෝමනස්ස ඉන්ද්‍රිය, ජීවිත ඉන්ද්‍රිය. මේ 8 දෙනාගෙන් සෝතාපත්ති මාර්ග ඥානය වසී භාවයට පත්වෙනවා.

ඊළඟට සෝතාපත්ති ඵලය. ඒත් එහෙමයි. සකෘදාගාමී මාර්ගය, සකෘදාගාමී ඵලය. ඒත් එහෙමයි. අනාගාමී මාර්ගය, අනාගාමී ඵලය. ඒකත් එහෙමයි. අර්හත් මාර්ගය, අර්හත් ඵලය. මේ සියල්ලම එකක් එකක් ගානේ මේ කියන ඉන්ද්‍රිය 8 න් වසී භාවයට පැමිණෙනවා. ඒ වසී භාවය කියන්නේ සම්පූර්ණයෙන් ඒකට රුකුල්දීමෙන් ඇති කරගන්නා ධෛර්යය. එතකොට ඒ වසී භාවයට පැමිණෙන අන්තිම අවස්ථාව තමා **මේ ආසවා නං ඛයෙ ඤාණං කියන්නේ.**

මේ 8 ක් 8 ක් බැගින් වූ ඉන්ද්‍රියයන්ගෙන් මාර්ග 4 සහ ඵල 4 කියන මේ සියලු දෙනා වසී භාවයට පැමිණීමෙන් සියලුම ආස්‍රවයන් ක්ෂය කිරීමේ උතුම් අවස්ථාව සිද්ධ වෙනවා අර්හත් මාර්ග ඵල අවස්ථාවේදී. මෙතන ආස්‍රව ආස්‍රව කියන්නේ මුලින් හැඳින්වූ කාමාස්‍රව, භවාස්‍රව, දිට්ඨාස්‍රව, අවිජ්ජාස්‍රව කියන 4 යි. එතනදි සෝතාපත්ති මාර්ග ඥාන කියන අනඤ්ඤා තඤ්ඤස්සාමීති ඉන්ද්‍රිය අවස්ථාවේ දී දිට්ඨාස්‍රවය සම්පූර්ණයෙන් ප්‍රහාණය වෙනවා. නැවත නූපදනා ආකාරයෙන් ප්‍රහාණය වෙනවා.

ඒවගේම දිට්ඨාසුවයට සම්බන්ධව තියෙනවානේ කාමාසුව, භවාසුව, අවිජ්ජාසුව කියන ආසුව 3, අපාගාමී ආසුව. අපාගාමී කාමාසුවය ප්‍රහාණය වෙනවා. අපාගාමී භවාසුවය ප්‍රහාණය වෙනවා. අපාගාමී අවිජ්ජාසුවය ප්‍රහාණය වෙනවා. ඒ ටික සියල්ලම සෝතාපත්ති මාර්ග අවස්ථාව අනඤ්ඤා තඤ්ඤාස්සාමීති ඉන්ද්‍රියෙන් ප්‍රහාණය වෙනවා.

ඊළඟට සකෘදාගාමි මාර්ග අවස්ථාවේ දී ඔය කියන ආසුවයන් අතුරෙන් කාමාසුවය තුනී කිරීම් වශයෙන් ප්‍රහාණය වෙනවා. එපමණක් නොවේ. ඒ කාමාසුවයට ඒකාබද්ධ වෙනවා. භවාසුවය, භවත්‍රයට ආසා කිරීම, ඒකත් තුනී කිරීම් වශයෙන් ප්‍රහාණය වෙනවා.

ඊළඟට අවිජ්ජාසුවය. කාමාසුවයට බැඳී තියෙන අවිජ්ජාසුව තුනී කිරීම් වශයෙන් ප්‍රහාණය වෙනවා.

අනාගාමී මාර්ග අවස්ථාවේ දීත් ඔය කියන කාමාසුවය සම්පූර්ණයෙන් ප්‍රහාණය වෙනවා. සකෘදාගාමි අවස්ථාවේ සිද්ධ වුනේ තුනීවීම. අනාගාමී මාර්ග අවස්ථාවේ සම්පූර්ණයෙන්ම කාමාසුවය ප්‍රහාණය වෙනවා. කාමාසුවය ප්‍රහාණය වෙනකොට ඒකට ඒකාබද්ධව තියෙන භවාසුවය හා අවිජ්ජාසුවය යන 2 කත් ප්‍රහාණය වෙනවා.

ඊට පසු අර්හත් මාර්ග ඥාන අවස්ථාවේ දී අවිජ්ජාසුවය සම්පූර්ණයෙන්ම ප්‍රහාණය වෙනවා. ඒ කියන්නේ භවාසුවයත් සමගම භවාසුවයේ තියෙනවානේ ඉතුරු කොටසක්. අර අවස්ථා 3 තේදී කොටසින් කොටස අඩුවෙලා ගිහිල්ලා අවිජ්ජාසුව දක්වා තිබුණු භවාසුවයේ කොටසත් ඒ සියල්ල සමග අවිජ්ජාසුවය සම්පූර්ණයෙන්ම ප්‍රහාණය වෙනවා. මේ විදියට චතුසට්ඨියා අකාරෙහි **තිණ්ණන්නං ඉන්ද්‍රියා නං වසී භාවතා පඤ්ඤා ආසවානං ඛයෙ ඤාණං.**

එතකොට මෙහිදී තවදුරටත් මේවා ගැන සවිස්තරව කියනවානම් එකක් එකක් ගානේ බොහෝම ලස්සන විසඳුම්.

සද්ධා ඉන්ද්‍රිය කියන්නේ මොකක් ද?

**යා සද්ධා සද්ධහනා**
**ඔකප්පනා අභිප්පසාදො**
**සද්ධා ඉන්ද්‍රියං සද්ධා බලං**

මේවා නමින් විස්තර කරනවා නම්, අපට පැය ගණනක් ඕන වෙනවා. ඉන්ද්‍රිය 8 දෙනා තවදුරට පැහැදිළි කරන්න. කෙසේ නමුත් කෙටියෙන් මෙතන හඳුන්වන්නේ. ශ්‍රද්ධාව කියන්නේ හිතේ ප්‍රසාදය. ඒ ප්‍රසාදය කියන එක ඇත්ත වශයෙන් ආකාර රාශියකට පහළ වෙනවා.

බුද්ධාදී රත්නත්‍රය කෙරෙහි ඇති උත්තරීතර ගුණස්කන්ධය ගැන සද්ධාව. ඒ හැර තමන් කරන දාන, ශීල, භාවනා ආදී කුසල ධර්මයන් පිළිබඳව අනුසස් දැන ගැනීමේ සිතේ ඇතිවන පැහැදීමට, ඒකටත් ශ්‍රද්ධාව කියනවා. ආනිසංස දක්නා නුවණ, ඒකත් ඒකාබද්ධ වෙනවා හැම තැනකදීම. ඒකට ශ්‍රද්ධාව කියනවා. කොටින්ම අපි කියනවා නම් සතෙකුට අපි කෑම ටිකක් දෙනවා. මේ කෑම දෙන වේලාවේ හිතුනොත් මේ සතා සුවපත් වේවා! මෛත්‍රීයෙන්. මෛත්‍රිය තියෙන විට එතන තියෙනවානේ සද්ධාව. ඒ හැර මේ සත්ත්වයා කියන්නේ අද මෙහෙම හිටියාට අනන්ත ජාතිවල සක්විති රජ වෙලා හිටියා. මගේ මව් වෙලා හිටියා. පියා වෙලා හිටියා. සහෝදරයා, සහෝදරිය වෙලා හිටියා. අනන්ත ජාතිවල මගේ ඥාති වෙලා හිටියා. මමත් අනන්ත ජාතිවල මේ වගේ තිරිසන් ආත්ම ගතකළා. අහෝ! මා මේ කරුණාවෙන් මෛත්‍රීයෙන් පිරිනමන මේ පරිත්‍යාගය නිසා කුසල් සිත් පහළ වෙල, අපට වගේ සුගතියක් ලැබේවා. කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ලැබී තුන් දොරින් සුසිරිත් පුරලා සුගතියට නිවනට පැමිණෙත්වා! හිතන කොට හිතේ ඇතිවෙනවා බලවත් මෛත්‍රියක්, ඥාන සම්ප්‍රයුක්ත මනසිකාරයත්. ඒ සම්බන්ධව පහළ වෙන සද්ධාව. ඒකත් ශ්‍රද්ධාවමයි. කුසල් හිතක මේ ශ්‍රද්ධාව පහළ වෙනවාමයි. ශ්‍රද්ධාව කියන එක ශෝභන සාධාරණ චෛතසිකයක්. ඒ නිසා මේ ශ්‍රද්ධාව බොහෝම පැතිරිච්ච එකක්. මෙහි තියෙනවා ලක්‍ෂණ රාශියක්. ඒ තමා,

සද්ධා සද්ධාහනා<br>
ඔකප්පනා අභිප්පසාදො සද්ධා<br>
සද්ධින්ද්‍රියං සද්ධා බලං කීචේ.

මේ සද්ධාව ඇදහීම, නැතිනම් පිළිගැනීම, ප්‍රසාදය, විශ්වාසය.<br>
සද්ධාහනා අදහන ආකාරය.<br>
ඔකප්පනා කියන්නේ එහි අරමුණේ ප්‍රසාදයෙන් බැහැගැනීම.<br>
සද්ධින්ද්‍රියං කියන්නේ සිත පැහැදීමේ ඉසුරුමත් කම.<br>
සද්ධා බලං කියන්නේ අශ්‍රද්ධාවෙන් කම්පා නොවෙන බලවත්

සද්ධාව. මේ විදියට නාම ඉන්ද්‍රියන් පිළිබඳව දීර්ඝ විස්තර තේරුම් දැනගත යුතුව තියෙනවා. ඒ සම්බන්ධව අපි ඉදිරි අවස්ථාවක බලමු.

දැන් මෙතනදී අපි සලකා ගන්න ඕනේ ඒ ඉන්ද්‍රිට 8 දෙනාගෙන් අර්හත් මාර්ග ඥානය, අර්හත් ඵල ඥානය වසී භාවයට පත් වූ බැවින් සූ සැට ආකාරයකින් වසී භාවයට පත් වූ ආකාරය ආසවක්ඛය කර ඥානය කියලා. ආසවක්ඛය කර ඥානය කිව්වේ මෙන්න අර්හත් මාර්ගයට පසුව, අර්හත් ඵල ඥානයට පසුව තමා ප්‍රත්‍යවේක්‍ෂා ඥාන සියල්ල පහළ වෙන්නේ. බොහෝ ගැඹුරු ඥානවන්තයාට ප්‍රත්‍යවේක්‍ෂා වීථි 19 ක් පහළ වෙනවා. ඒ අවස්ථාවේදී පහළ වෙලා තියෙනවා සෝතාපත්ති මාර්ග - ඵල ඥානයට අනතුරුව ප්‍රත්‍යවේක්‍ෂා වීථි 5 කි. ඔය වගේ සකෘදාගාමි මාර්ග - ඵලයට අනතුරු ප්‍රත්‍යවේක්‍ෂා වීථි 5 කි. අර්හත් මාර්ග - ඵලයට අනතුරුව ප්‍රත්‍යවේක්‍ෂා වීථි 4 කි. එතකොට සියල්ල 19 යි.

ලොවුතුරා බුදුරජාණන් වහන්සේට ඔය 19 ආකාරයකින් ප්‍රත්‍යවේක්‍ෂා ඥාන වීථි පහළ වුනා.

**මග්ගං ඵලං ච නිබ්බාණං**
**පච්ච වෙක්ඛති පණ්ඩිතො**
**හීනෙ කිලෙසෙ සෙසෙච**
**පච්ච වෙක්ඛති වා නවා.**

ඒ කියන්නේ ඥානවන්තයා තමා ලබාගත් මාර්ගයත් ප්‍රත්‍යවේක්‍ෂා කරනවා. ඵලයත් ප්‍රත්‍යවේක්‍ෂා කරනවා. තමන් ලබාගත් නිර්වාණයත් ප්‍රත්‍යවේක්‍ෂා කරනවා. තමන්ගේ සන්තානයේ ප්‍රහීණ වෙච්ච ක්ලේශයන් ප්‍රත්‍යවේක්‍ෂා කරනවා. ඒ වගේම ඉතිරි ක්ලේශ තියෙනවා නම්, අර අට මාර්ග - ඵල අවස්ථාවේ දී ඒවත් ප්‍රත්‍යවේක්‍ෂා කරනවා. අර්හත් ඵලයට අනතුරුව ඉතිරි ක්ලේශයන් ප්‍රත්‍යවේක්‍ෂා කිරීමක් නැහැ. ඉතින් ඒ ප්‍රත්‍යවේක්‍ෂාට කියනවා එකුන් විසි ප්‍රත්‍යවේක්‍ෂා කියලා. මේ විදියට සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගේ සන්තානයෙහි ඔය කියන චතුසට්ඨියා ආකාරෙහි වසී භාවයට පත් වූ අර්හත් මාර්ග ඥානය අවස්ථාව. එසේ මෙසේ එකක් නොවේ. ඒ තත්ත්වයට පත් වෙන කොට භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ සන්තානයෙහි ලෝකයේ දතයුතුතාක් සියල්ල අරමුණු කරන්නා වූ සර්වඥතා ඥානය පිහිටියා.

සත්විධ බුද්ධ ධර්ම, අභිඥා ධර්ම චුද්දස බුද්ධ ඥාන, සොළොස මහා ඥාන, අට්ඨාරස ආවේණික බුද්ධ ගුණ, එකුන් විසි ප්‍රත්‍යවේක්ෂා ඥාණ, සමත්‍රිංසත් පාරමිතා ඥාන, චත්තාලීසාකාර මහා විපස්සනා ඥාන, ඒ වගේ උදව්‍ය ඥාන 50 ක්. ඒ වගේම දෙසැටක් මිථ්‍යා දෘෂ්ඨි පරිච්ඡේදක ඥාන, තෙසැත්තෑ ඥාන, සත් සැත්තෑ ඥාන, සූවිසි කෝටි ලක්‍ෂවාර මහා කරුණා සමාපත්ති ඥාන, ආදී අනන්ත වූ අප්‍රමාණ වූ ඒ ඥාන සියල්ලම ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සන්තානයෙහි පහළ වුනා.

මේ සෝතාපත්ති මාර්ග - ඵල ඥාන අවස්ථා ශ්‍රාවකයන්ට ලැබෙනවා. නමුත් ඒ ශ්‍රාවකයන් වහන්සේලාගේ මාර්ග - ඵල ඥාන අවස්ථාව සලකා බැලුවාම අහසට - පොළොව මෙන්, මුහුදේ එතර - මෙතර මෙන්, දුරස්ථයි. සර්වඥයන් වහන්සේගේ සෑම ඥාන ධර්මයකටම විශේෂ වූ නමක් තියෙනවා. **අසාමාන්‍ය ඥාණ** කියලා. අසාමාන්ත කියන්නේ සමීප නැහැ.

සැරියුත් මහ රහතන් වහන්සේ ප්‍රඥාවෙන් අග්‍රයි. ඒ හා සමාන කිසිම ශ්‍රාවකයෙක් නැහැ. ප්‍රඥාවෙන් අග්‍ර සාරිපුත්ත මහ රහතන් වහන්සේට පුළුවන් සතර මහා දීපයට වහින වැස්සේ වතුර බිංදු ගණන් කරලා කියන්න. ගංගානම් ගඟේ මුල සිට අග දක්වා ඇති වැලි කැට ගාන කියන්න පුළුවනි. මේ තරමට ඒ සාරිපුත්ත මහ රහතන් වහන්සේගේ ප්‍රඥාව පුදුම විදියේ විසදයි. නමුත් ඒ සාරිපුත්ත මහ රහතන් වහන්සේගේ ප්‍රඥාවටත් වඩා අසාමාන්තයි සර්වඥ බුදුරජාණන් වහන්සේගේ ප්‍රඥාව.

ඒ නිසා ඒ අනන්ත ප්‍රඥා සම්භාරයෙන් අග තැන්පත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්ස්ගේ සන්තානයේ පහළ වූ ඒ ආසවක්ඛය කර ඥානය ගැනයි. මේ තෙසැත්තෑ ඥානයේ පිහිටි 55 වෙනි ඥානය හඳුන්වලා තියෙන්නේ. ඒවා ඉතින් නැවත නැවත ආවර්ජනා කරන්න වෙනවා. ඒ වෙලාවේ මේ කියන කරුණු ටික හරියට විදුලියක් කොටලා විදුලි එළිය නැතිවුනා වගේ වෙන්න පුළුවනි. විදුලි එළිය පහළ වෙලා එක පාරටම ඒක නැතිවෙලා යනවා. ඒ වගේ එකපාරට අමතක වෙන්න පුළුවනි. නමුත් මේවා නැවත නැවත මෙනෙහි කරන්න ඕනේ. සොයා බලන්න ඕනේ. පොත් පත් කියවන්න ඕනේ. සාකච්ඡා කරන්න ඕනේ. ඒ වගේ පෙළ ගැහිලා, සකස් වෙලා වැඩ කරනවා නම්, යම් තරමකින් අවබෝධ කරගන්න පුළුවනි. මේ සම්බන්ධව දීර්ඝ විස්තරයක් පටිසම්භිදා මග්ග

පාලියෙහි ඥාන කථා දේශනාවේ දී හැඳින්වෙනවා. ඒකෙන් බිංදුවක් තමා මේ දේශනා කරන්න යෙදුනේ.

සර්වඥතා ඥාන ප්‍රතිලාභය සමග සූසැට ආකාරයකින් වශී බවට පත් අර්හත් මාර්ග ඵල ප්‍රතිලාභයෙන් අනුත්තර සම්මා සම්බෝධියට පත් වී සූවිසි අසංඛ්‍ය නවකෝටි සැට ලක්ෂයක් දෙනාට අමා මහ නිවන් සුව වැළඳ වූ අනන්ත ඥාන ඇත්තා වූ ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට අපගේ උත්තමාචාර ගෞරව නමස්කාරය වේවා. අපගේ ජීවිතය ද පූජා වේවා. අපටත් සූසැට ආකාකරයෙන් වසී බවට පත්වන්නා වූ ප්‍රඥාව සාක්ෂාත් කරගනීමට වාසනා වේවා යයි ප්‍රාර්ථනා කරමු.

සීලයක පිහිටා ධර්ම ශ්‍රවණය කිරීමේ කුශලානිසංසයෙන් දෙලොව සුබසෙතත්, ශාන්ති ලක්ෂණ නිර්වාණ ධාතුවත් සුවසේ සාක්ෂාත් වේවා.

**ආකාසට්ඨා ච භූමට්ඨා ........**

**සබ්බීතියො විවජ්ජන්තු ........**

**භවතු සබ්බ මංගලං ........**

**අභිවාදන සීලිස්ස ........**

**ආයුරාරොග්‍ය සම්පත්ති ........**

## “සබ්බ දානං ධම්ම දානං ජිනාති”

දානයන් අතුරෙන් ධර්ම දානය උතුම් දානය වේ. යමෙකුට සක්වල ගැබ පුරා අතුරු සිදුරු නැතිව වැඩ සිටින්නාවූ බුදු, පසේබුදු, මහ රහතන් වහන්සේලාට දෙන සිවුරු ආහාර පාන ආදී ආමිස දානයටත්, මහා විහාරය වැනි විහාරයන් ලක්ෂ ගණනක් කරවා පවත්වන මහා සේනාසන දානයට ද වඩා ධර්ම දානය උතුම් බව දක්වා තිබේ.

සත්ත්වයන් නිවන් මඟට පමුණුවනු සඳහා දහම් දෙසීම ශ්‍රේෂ්ඨ තර ධර්ම දානයය. ධර්ම කථිකයන් ලවා, බුදු බණ දේශනා කරවීම ද බණ පොත් පුජා කිරීම ද, බුද්ධ ධර්මය උගන්වන ගුරුවරුන්ට හා ශිෂයන්ට උපකාර කරවීම ද ධර්මයාගේ චිරස්ථිතියට හා ව්‍යාප්තිය පිණිස කළ හැකි කිනම් දෙයක් වුවත් කිරීම ද ධර්ම දානය වන්නේය.

---

සැ: යු:- මෙම දහම් පොත කියවීමෙන් පසුව ශ්‍රද්ධාවන්ත වෙන කෙනෙකුට කියවීමට සැලැස්වීමෙන් ඔබට ද ධර්ම දානමය කුසලයට දායකත්වය ලබාගත හැකි බව කරුණාවෙන් සලකන්න.

බුද්ධාදී රත්නත්‍රය කෙරෙහි ඇති උත්තරීතර ගුණස්කන්ධය ගැන සද්ධාව. ඒ හැර තමන් කරන දාන, ශීල, භාවනා ආදී කුසල ධර්මයන් පිළිබඳව අනුසස් දැන ගැනීමේ සිතේ ඇතිවන පැහැදීමට, ඒකටත් ශ්‍රද්ධාව කියනවා. ආනිසංස දක්නා නුවණ, ඒකත් ඒකාබද්ධ වෙනවා හැම තැනකදීම. ඒකට ශ්‍රද්ධාව කියනවා. කොටින්ම අපි කියනවා නම් සතෙකුට අපි කෑම ටිකක් දෙනවා. මේ කෑම දෙන වේලාවේ හිතුනොත් මේ සතා සුවපත් වේවා! මෛත්‍රීයෙන්. මෛත්‍රිය තියෙන විට එතන. තියෙනවානේ සද්ධාව. ඒ හැර මේ සත්ත්වයා කියන්නේ අද මෙහෙම හිටියාට අනන්ත ජාතිවල සක්විති රජ වෙලා හිටියා. මගේ මව් වෙලා හිටියා. පියා වෙලා හිටියා. සහෝදරයා, සහෝදරිය වෙලා හිටියා. අනන්ත ජාතිවල මගේ ඥාති වෙලා හිටියා. මමත් අනන්ත ජාතිවල මේ වගේ තිරිසන් ආත්ම ගතකළා. අහෝ! මා මේ කරුණාවෙන් මෛත්‍රීයෙන් පිරිනමන මේ පරිත්‍යාගය නිසා කුසල් සිත් පහළ වෙල, අපට වගේ සුගතියක් ලැබේවී

Lithira
0718152131/lithira 2008@yahoo.com.